ශ්‍රී ලංකා නීතිඥ සංගමය
இலங்கைச் சட்டத்தரணிகள் சங்கம்
BAR ASSOCIATION OF SRI LANKA

**<u>සිංහල පරිවර්තනය</u>**

2021 නොවැම්බර් 2 වනදා

අතිගරු ගෝඨාභය රාජපක්ෂ මහතා,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 1

අතිගරු ජනාධිපතිතුමනි,

**<u>'එක රටක් - එක නීතියක්' උදෙසා ජනාධිපති කාර්යසාධන බලකායක් පත්කිරීම</u>**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වගන්තියෙන් පැවරෙන බලතල ප්‍රකාරව 'එක රටක් - එක නීතියක්' උදෙසා ජනාධිපති කාර්යසාධන බලකායක් පත්කිරීම සඳහා ජනාධිපතිතුමන් විසින් ගෙන තිබෙන පියවර කෙරෙහි ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ අවධානය යොමුවී තිබේ.

ජනාධිපති ලේකම්වරයා විසින් ප්‍රසිද්ධ කරන ලද ගැසට් නිවේදනයෙහි ප්‍රකාශ වන අකාරයට එම කාර්යසාධන බලකාය සඳහා පත්කිරීම් සිදුකරනු ලබන්නේ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රකාශිත අන්දමට යුක්තිය පසිඳලීම, එය ක්‍රියාත්මක කිරීම සහ නීතියේ ආරක්ෂාව සියලුදෙනාට සාධාරණ වියයුතුය යන කරුණ කෙරෙහි අවධානය යොමු කරමිනි. මූලික අයිතිවාසිකම් අනුව, ජාති, ආගම්, කුල හෝ වෙනත් පදනම් මත කිසිදු පුරවැසියකු නීතිය ඉදිරියේ වෙනස් අන්දමින් සැලකීමකට ලක්නොවිය යුතු බව ද, විශේෂ සැලකීමකට භාජනය නොවිය යුතු බව ද එම නිවේදනයේ සඳහන් වේ. 'එක රටක් - එක නීතියක්' සංකල්පය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් මානුෂීය වටිනාකම් තහවුරු කිරීමේ ක්‍රමවේදයක් බව එහි දැක්වේ. එබැවින් සියලු පුරවැසියන් හට නීතිය ඉදිරියේ සමාන සැලකිලි ලැබෙන බව වැඩිදුරටත් තහවුරු කළ යුතු බව ද එම නිවේදනය පවසයි.

ශ්‍රී ලංකාව තුළ 'එක රටක් - එක නීතියක්' සංකල්පය ක්‍රියාත්මක කරන ආකාරය කාර්යසාධන බලකාය විසින් අධ්‍යයනය කළ යුතු අතර එම අරමුණ වෙනුවෙන් නීතියක් කෙටුම්පත් කළ යුතුය. මෙම විෂය සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍යාංශය විසින් දැනටමත් සම්පාදනය කර තිබෙන නීති කෙටුම්පත හා එහි යෝග්‍යතාව අධ්‍යයනය කළ යුතුය. ඒ හා සම්බන්ධ සංශෝධන වෙනුවෙන් යෝජනා ඉදිරිපත් කළ යුතුය.

නීතියක් කෙටුම්පත් කිරීම හා දැනට පවතින නීති අධ්‍යයනය කිරීම රජයේ ආයතන ගණනාවක් සම්බන්ධ කරගෙන සිදුකළ යුතු බරපතල කාර්යයන් බව ඔබතුමන් හොඳින් දන්නා බවට සැකයක් නැත. නීති සම්පාදන බලය යනු මහජන ස්වෛරීභාවයේ එක් සාධකයකි.



President Saliya Pieris PC | Deputy President Anura Meddegoda PC | Secretary Rajeev Amarasuriya | Treasurer Rajindh Perera | Assistant Secretary Pasindu Silva
No. 153, Mihindu Mawatha, Colombo 12, Sri Lanka.
Telephone : +94 11 2447134, +94 11 2331697, Fax : +94 11 2448090 E-mail: basl.lawnet@gmail.com Web: www.basl.lk

නීති සම්පාදනය සඳහා ක්‍රමවේදයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින්ම සම්පාදනය කර තිබේ. වෙනත් නීති හා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග මගින් එය ශක්තිමත් කරනු ලැබේ. මෙම අරමුණ වෙනුවෙන් ප්‍රමාණවත් නීති හා ස්ථාවර නියෝග ද, යෝග්‍ය යාන්ත්‍රණයන් ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා රාමුව තුළ දැනටමත් අන්තර්ගත වේ. පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභා මෙන්ම ස්ථාවර කාරක සභා සහ පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අනුව පිහිටුවිය හැකි තේරීම් කාරක සභා ද, නීත්‍යානුකූලව ස්ථාපිත කර තිබෙන නීති කොමිෂන් සභාව ද මෙම යාන්ත්‍රණයන්ට අයත්ය. එයට අමතරව, පසුගිය වසරේදී විවිධ නීති සංශෝධන යෝජනා කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය විසින් කමිටු කීපයක් ද පත්කර තිබේ.

ආංශික අධීක්ෂණ කාරක සභාවල සාමාජිකත්වය හොබවන්නේ ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරුන් විසිනි. නීති කොමිෂන් සභාවේ සභාපතිත්වය හොබවනු ලබන්නේ ජ්‍යෙෂ්ඨ ජනාධිපති නීතීඥවරයකු විසිනි. අධිකරණ ඇමතිවරයා විසින් පත්කරනු ලබන බොහෝ කමිටු ද සමන්විත වන්නේ නීති වෘත්තියෙහි ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් හා ප්‍රවීණ විද්‍යාර්ථීන් විසිනි. ඇතැම් කමිටුවල සභාපතිත්වය දරන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් විසිනි.

මෙම යාන්ත්‍රණයන්ට අමතරව, නීතිපතිවරයා හා ඔහුගේ දෙපාර්තමේන්තුව ද නීති සම්පාදන ක්‍රියාවලියේදී ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරයි. එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් පිළිගෙන තිබේ. මෙම ක්‍රියාවලිය තුළ නීතිපති දෙපාර්තමේන්තුව ද වැදගත් භූමිකාවක් ඉටුකරන සංදර්භය තුළ, නීතිපතිවරයාගේ හා නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ භූමිකාවන් හා ජනාධිපති කාර්යසාධක බලකායේ භූමිකාව පිළිබඳ ප්‍රශ්න මතුවේ.

මෙම පසුබිම තුළ, අධිකරණ අමාත්‍යාංශයේ කාර්යයන් අධීක්ෂණය කිරීම සඳහා ජනාධිපති කාර්යසාධන බලකායක් පිහිටුවීම අයෝග්‍ය බව හා එය නීති සම්පාදන ක්‍රියාවලියේ පිළිගත් නීත්‍යානුකූල රාමුවට අයත් නොවන බව ශ්‍රී ලංකා නීතීඥ සංගමයේ මතයයි. නීත්‍යානුකූලව තේරී පත්වූ මහජන නියෝජිතයන්ගේ බලතල සහ නිසි ජනවරමක් සහිත විධායක බලතල වෙනත් බාහිර ව්‍යුහයන් වෙත පවරාදීම මගින් මහජන ස්වෛරීභාවය බිඳවැටෙනු ඇත.

මෙ ජනාධිපති කාර්යසාධක බලකාය නිසි නියෝජනයක් සහිත ව්‍යුහයක් නොවන බව ද ශ්‍රී ලංකා නීතීඥ සංගමය විසින් වැඩිදුරටත් නිරීක්ෂණය කර තිබේ. එහි කාන්තා සහ ජනවාර්ගික හා ආගමික කණ්ඩායම් කීපයක නියෝජනයක් නැත. එසේම, ගැසට් නිවේදනයේ විස්තර කර තිබෙන කාර්යයන් ඉටුකිරීමේදී එම ජනාධිපති කාර්යසාධක බලකායේ සභාපතිවරයාගේ හා බොහෝ සාමාජිකයන්ගේ සුදුසුකම්, විශේෂඥභාවය හා යෝග්‍යභාවය පිළිබඳ බරපතල සැකයන් මතුවේ.



President Saliya Pieris PC | Deputy President Anura Meddegoda PC | Secretary Rajeev Amarasuriya | Treasurer Rajindh Perera | Assistant Secretary Pasindu Silva

No. 153, Mihindu Mawatha, Colombo 12, Sri Lanka.
Telephone : +94 11 2447134, +94 11 2331697, Fax : +94 11 2448090 E-mail: basl.lawnet@gmail.com Web: www.basl.lk

සමානාත්මතාව, සාධාරණත්වය, වෙනස්කම් සිදු නොකිරීම, නීතිය ආරක්ෂා කිරීම සහ ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් මානුෂීය වටිනාකම් ආරක්ෂා කිරීම යනු අගය කළ යුතු මූලධර්මයන් බවට සැකයක් නැත. එහෙත්, ගැසට් නිවේදනය මගින් ප්‍රකාශිත ක්‍රියාවලිය සහ කාර්යසාධන බලකායක් පිහිටුවීම මගින් මෙම වටිනාකම් නගාසිටුවීම සඳහා කිසිදු අර්ථවත් කාර්යභාරයක් ඉටුවේද යන්න සැක සහිතය.

වර්තමානයේදී අතිශය වැදගත් වන්නේ රජය සහ අතිගරු ජනාධිපතිතුමා ප්‍රධානත්වය හොබවන විධායකය ඇතුළු ආණ්ඩුවේ කොටස් විසින් නීතියේ ආධිපත්‍යය පිහිටුවීම සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(ඈ) වගන්තිය මගින් විස්තර කර තිබෙන මහජනතාවගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා කටයුතු කිරීමයි. ඇත්ත වශයෙන්ම, ගැසට් නිවේදනය මගින් ප්‍රකාශිත අරමුණු ඉටුකිරීම සඳහා තිබෙන හොඳම ක්‍රමය වන්නේ නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීම හා මහජනතාවගේ මූලික අයිතිවාසිකම්වලට ගරුකිරීමයි.

පසුගිය මාස කීපය තුළ, නීතියේ ආධිපත්‍යය අභියෝගයට ලක්වූ හා මහජනතාවගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ අවස්ථා කීපයකදී, නීතියේ ආධිපත්‍යය වෙනුවෙන් ඇපකැප වූ සංවිධානයක් වන ශ්‍රී ලංකා නීතීඥ සංගමය විසින් ගරු ජනාධිපතිවරයාගේ හා රජයේ අවධානය ඒ වෙත යොමුකරන ලදී. කෙසේ වෙතත්, ඒ සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිකර්මයක් සිදුකර නොමැති බව ද ශ්‍රී ලංකා නීතීඥ සංගමය කණගාටුවෙන් යුතුව සටහන් කරයි.
මෙහිදී විස්තර කරන ලද තත්වයන් තුළ, ඉහත සඳහන් කරන ලද ජනාධිපති කාර්යසාධක බලකාය පත්කිරීම මගින් කිසිදු ප්‍රයෝජනයක් අත්නොවන බව ශ්‍රී ලංකා නීතීඥ සංගමයේ අදහස වේ. එම කාර්යසාධක බලකාය පිහිටුවීම හේතුවෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා නීතිය අනුව පිහිටුවන ලද පාර්ලිමේන්තුව හා අධිකරණ අමාත්‍යාංශය ඇතුළු බොහෝ ආයතනවල ක්‍රියාකාරීත්වයට බාධා සිදුවන බව ද ශ්‍රී ලංකා නීතීඥ සංගමයේ මතයයි.

මෙයට විශ්වාසී,

අත්සන් කළේ,

**ජනාධිපති නීතිඥ සාලිය පීරිස්**
**සභාපති**
**ශ්‍රී ලංකා නීතිඥ සංගමය**

**රජීව් අමරසූරිය**
**ලේකම්**
**ශ්‍රී ලංකා නීතිඥ සංගමය**



| President | Deputy President | Secretary | Treasurer | Assistant Secretary |
|---|---|---|---|---|
| Saliya Pieris PC | Anura Meddegoda PC | Rajeev Amarasuriya | Rajindh Perera | Pasindu Silva |

No. 153, Mihindu Mawatha, Colombo 12, Sri Lanka.
Telephone : +94 11 2447134, +94 11 2331697, Fax : +94 11 2448090 E-mail: basl.lawnet@gmail.com Web: www.basl.lk